# 2022 මැයි මස 25 වන දින පැවැති ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව

## කමිටු සාමාජිකයන්

1. ඉන්දික හෙන්දාවිතාරණ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සභාපති
2. දුමින්දු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ආර්.ඒ.ඩබ්.ඩී.ඩබ්.ටී.විමුක්ති රණවීර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. රෝෂාන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
5. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
6. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කීර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

## නොපැමිනිම

1. දුමිදු දයාසෙන් රටියල මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
2. රෝෂන් ඉස්මත් බුහාරි මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
3. ඊ.පි.අසේල ඉන්දික විජේසිංහ මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික
4. ඩබ්.ජී.සි.කේ.ප්‍රභාත් කිර්ති වැවේගෙදර මැතිතුමා - ගරු නාගරික මන්ත්‍රී / කමිටු සාමාජික

## නිලධාරි

1. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. කේ.ජී.එන්.සි.බණ්ඩාර මහතා - නාගරික ඉංජිනේරු
3. එන්.පි.කේ.රණසිංහ මිය - පරිපාලන නිලධාරි
4. ජී.වි.ආර්.ඩබ්.ජේ.බණ්ඩාර මහතා - ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක
5. එරික් ප්‍රසන්න මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
6. එම්.ජී.සි.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
7. ටි.එල්.එස්.පිරිස් මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(මුදල්)
8. එස්.අයි.සිල්වා මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි(පාලන)
9. පද්මා සෙනෙවිරත්න මිය - සැළසුම් අංශ ප්‍රධානි
10. රංජිත් හෙට්ටිආරච්චි මහතා - ක්‍රීඩා නිලධාරි
11. ප්‍රියන්ත එදිරිසිංහ මහතා - ක්‍රීඩා නිලධාරි
12. ඩි.එම්.අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
13. ඩි.එම්.අරුණ රන්දෙනිගම මහතා - ආරක්ෂක අධික්ෂණ නිලධාරි (වැ.බ.)
14. ජේ.බී.මධුෂා ගයත්‍රී මෙනවිය - විෂය ලිපිකරු

## නිලධාරි නොපැමිණිම

1. ජයනී රාජකරුණා මිය - නාගරික ගණකාධිකාරි
2. එරික් පි මදනායක මහතා - ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
3. එම්.ජී.සි.සනත් මහතා - ප්‍රධාන ආදායම් පරික්ෂක
4. ඩි.එම්.අනුර නිශාන්ත මහතා - ක්‍රීඩා භූමි උපදේශක
5. ඩි.එම්.අරුණ රන්දෙනිගම මහතා - ආරක්ෂක අධික්ෂණ නිලධාරි (වැ.බ.)

1. 2022.04.22 දින වාර්තාවේ අංක 04 යටතේ කැබිනට් වෙළඳ ගරු අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමාගේ මුදල් ප්‍රතිපාදන මත නාගරික මන්ත්‍රී ඉන්දික හෙන්දාවිතාරන මැතිතුමාගේ යෝජනාවකට අනුව ස්වභා උයනේ විදුලි ආලෝක සඳහා රුපියල් 900,000.00 ක් හා ඇවිදින මංතිරු පිළියල කිරිම සඳහා රුපියල් 1,850,000.00 ක මුදලක් වෙන් කර ඇත. දෙස් විදෙස් සංචාරක ආකර්ශනිය ස්ථානයක් බවට පත්කිරිමේ අරමුණ ඇතිව මෙහි වැඩ නිමකර ඇති බැවින් ස්වභා උයන ඇතුලත ශ්‍රමදාන කටයුත්තක් සිදු කිරිමට නියමිතය.
   ශ්‍රමදාන කටයුතු සඳහා සිවිල් ආරක්ෂක අංශයෙන් සහය ලබා ගැනිම සහ එම අංශයෙන් පහසු දිනයක් නම් කර එවන ලෙස දන්වා ලිපියක් යොමු කිරිමට තීරණය විය. (වගකිම - නාගරික සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි)

2. අනුරාධපුර,හිදෝගම,පොල් අඹයාගම,අනුරාධපුර දිස්ත්‍රික් සැහැල්ලු පන්දු ක්‍රිකට් සංගමය විසින් ලිපියක් යොමු කරමින් ශ්‍රී ලංකා සැහැල්ලු පන්දු ක්‍රිකට් සම්මේලනයේ අනුරාධපුර දිස්ත්‍රික් සංවිධායක ලේකම් වරයා ලෙස බී.ඩී.එස්.ඩබ්.අමරබන්දු මහතා පත් කර ඇති බැවින් ඉදිරියේදි සැහැල්ලු පන්දු ක්‍රිකට් තරඟ සංවිධාන කටයුතුවලදී මෙතුමාගේ සහය ලබා ගන්නා ලෙස කර ඇති ඉල්ලීම.
   මෙම ලිපිය සභා ගත කිරිමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු )

3. ක්‍රීඩා නිලධාරි,රංජිත් හෙට්ටිආරච්චි මහතා සහ ප්‍රියන්ත එදිරිසිංහ මහතා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් එල්.ජී.ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමාගේ ඉල්ලිම මත බණ්ඩාර පුලියන්කුලම ක්‍රීඩා පිටියේ විකට්ටුව සෑදීම සඳහා අවශ්‍ය බොරළු ට්‍රැක්ටර් ලෝඩ් 01 ක් ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම.
   බොරළු ලබාදීමට තීරණය විය. (වගකිම - නාගරික ඉංජිනේරු)

4. ආගමික, සංස්කෘතික, ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවට වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ වාර්තාවක් ඊළඟ කමිටුව වෙත යොමු කිරිමට තීරණය විය. (වගකිම - සැළසුම් අංශ ප්‍රධානි)

<u>මුදල් ස්ථාවර කමිටු නිර්දේශයන් සඳහා</u>

- නාගරික මන්ත්‍රී විරාජ් ධනංජය රණවිර මැතිතුමා විසින් ලිපියක් ඉදිරිපත් කරමින් අංක 03 හේනවත්ත කොට්ඨාශයේ වුෂු ක්‍රීඩාව නගාසිටුවිමට පියවර ගෙන ඇත. ඒ සඳහා පුහුණු උපදේශකයෙකු තෝරා ගෙන දැනට පුහුණුවිම් පවත්වා ගෙන යන අතර පුහුණුකරුගේ ප්‍රවාහන වියදම් සඳහා මාසිකව රු.5000.00 බැගින් සෑම මසකම කොට්ඨාශ ප්‍රතිපාදන යටතේ ලබාදීමට කල යෝජනාව අනුමැතියට යොමු කිරිම.

- උතුරු මැද පළාත, පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුව, දුර්ගා ජයසිංහ මහත්මිය විසින් ලිපියක් ඉදිරිපත් කරමින් 2022.04.02 වන දින මහා නගර සභාව මගින් පැවැත්වූ අවුරුදු උත්සවය සඳහා සහභාගී වූ නර්තන ශිල්පීන්ගේ ගෙවීම් සඳහා පහත සඳහන් කර ඇති මුදල ලබාදීමට කටයුතු කරන ලෙස කර ඇති ඉල්ලීම අනුමැතියට යොමු කිරිම.

  එක් ශිල්පියෙකුට රුපියල් 1650.00 බැගින් ශිල්පීන් 16 ක් සඳහා = රු.26,400.00

**වෙනත්**

- ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ 2022 වර්ෂයේ සංශෝධිත වාර්ෂික සැළස්ම. (ඇමුණුම 01)
- 2022 අප්‍රේල් මස 02 වන දින පැවැත්වූ බක් මහා උළලේ පෞද්ගලික අනුග්‍රහකයින්ගේ මුදල් වටිනාකම් හා ත්‍යාග ප්‍රදානයන් වූ ආකාරය. (ඇමුණුම 02)

ඉන්දික හෙන්දාවිතාරණ,
නාගරික මන්ත්‍රී / කමිටු සභාපති,
ආගමික,සංස්කෘතික,ක්‍රීඩා හා සංචාරක කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුව,
මහා නගර සභාව,
අනුරාධපුර.